සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2019 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.



# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,128- 2019 ජුනි මස 14 වැනි සිකුරාදා - 2019.06.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1152 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1155 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - (i) පඩිපාලක සභා (සංශෝධන) පනත් කෙටුම්පත 2019 ජුනි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ආගාමික හා විගාමික (සංශෝධන) පනත් කෙටුම්පත 2019 ජුනි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ජූලි මස 05 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජුනි මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1151 - B 81532 — 5,403 (2019/06)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ පිළිගැනීමේ නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම

බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 02 සේවා ගණයේ පිළිගැනීමේ නිලධාරී තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *වැටුප් කේතය* :- MN-1 2016 (රා. ප. ච. ලේ. 03/2016 අනුව)

*වැටුප් පරිමාණය* :- රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540

(රා. ප. ච. ලේ. 03/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදු කරනු ලබයි.)

02. *බඳවා ගන්නා ශ්‍රේණිය* : III ශ්‍රේණිය

03. *සේවා කොන්දේසි* :- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.)

04. *බඳවා ගැනීමේ සුදුසුකම්* :

4.1 *අධ්‍යාපන සුදුසුකම්.-*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

4.2 *කායික සුදුසුකම්* : තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4.3 *වෙනත්* :

4.3.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

4.3.2 යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

4.3.3 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට අවම වශයෙන් වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

4.3.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

4.3.5 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමවේදය* :

සුදුසුකම් ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

| *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| දේශපාලනික, සංස්කෘතික, සාමාජයීය හා ආර්ථික කරුණු සම්බන්ධයෙන් සාමාන්‍ය දැනීම | 30 | 50 |
| තනතුරට අදාළ රාජකාරී පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 30 | |
| මහජන සම්බන්ධතාවය | 25 | |
| භාෂා ප්‍රවීණතාවය - මව් භාෂාවට අමතරව වෙනත් භාෂා කතා කිරීමේ/අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව | 10 | |
| පෞරුෂය | 5 | |
| **මුළු එකතුව** | **100** | **50** |

06. *අයදුම්පත් එවනු ලබන පිළිවෙල :*

6.1 අයදුම්කරුවන් විසින් මේ සමග අමුණා ඇති ආකෘතිය අනුව, අයදුම්පත සම්පූර්ණ කර ''පිරිස් හා පුහුණු අංශය'', ප්‍රධාන ලේකම් කාර්යාලය (බ. ප.), අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත යන ලිපිනයට 2019.07.14 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාරදිය යුතුය. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''ප්‍රධාන ලේකම් කාර්යාලයේ පිළිගැනීමේ නිලධාරී තනතුර'' යනුවෙන් සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.2 අයදුම්පත්‍රය රජයේ විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරීවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු රු. 498,960 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

07. මෙම නිවේදනයේ විධිවිධාන සලසා ඇති හෝ නොමැති කරුණක් සම්බන්ධයෙන් ගැටළු පැන නගින අවස්ථාවක දී එය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාත.

ආදර්ශ අයදුම්පත

**ප්‍රධාන ලේකම් කාර්යාලයේ කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 02 සේවා ගණයේ පිළිගැනීමේ නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

01. (i) මුලකුරු සමග අගට යෙදෙන නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :................................................................

.................................................................................................................................

(ii) සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :................................................................

.................................................................................................................................

(iii) සම්පූර්ණ නම : (සිංහලෙන්) :................................................................

.................................................................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : කොළඹ : ☐ ගම්පහ : ☐ කළුතර : ☐

04. ස්ථිර ලිපිනය :.....................................................................................................................................

05. දුරකතන අංකය :..........................................................................................................

06. උපන් දිනය :..........................................................................................................

07.2019.07.14 වැනි දිනට වයස :..........................................................................................

08. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

09. අධ්‍යාපන සුදුසුකම් :

*අ.පො.ස. (සා. පෙළ) විභාගය :*

වර්ෂය :..................... විභාග අංකය :...........................

| අ.පො.ස. (සා. පෙළ) විභාගය | | |
|---|---|---|
| | *විෂයය* | *සාමාර්ථ්‍ය* |
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |

*අ.පො.ස. (උ. පෙළ) විභාගය :*

වර්ෂය :..................... විභාග අංකය :...........................

| අ.පො.ස. (උ. පෙළ) විභාගය | | |
|---|---|---|
| | *විෂයය* | *සාමාර්ථ්‍ය* |
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

10. ..........................................................................................................වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරව ම දනිමි.

.........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...........................

11. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.* (අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය............................................................ දින හා ඉදිරිපිට දී ඔහු/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

සහතික කරන අයගේ නම :.......................................................................................................
අත්සන :.......................................................................................................
තනතුර හා නිල මුද්‍රාව :.......................................................................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරිවරයෙකු පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු රු. 4,98,960 වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.)

06-435

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියේ තනතුර සඳහා විවෘත බඳවා ගැනීම - 2019

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියේ තනතුරේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019 ජූලි මස දී කුරුණෑගල නගරයේ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයක දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

01. *වැටුප් පරිමාණය :-*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය MN 3 - 2016 අනුව,

රු. 31,040 - 10 x 445-11 x 660-10 x 730-10 x 750 - රු. 57,550/= වේ.
(2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව)
නමුත් 2020.01.01 දක්වා එම චක්‍රලේඛයේ විධි විධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

02. *සුදුසුකම් :-*

2.1 *අධ්‍යාපන සුදුසුකම් :*

*අ.පො.ස. (උ.පෙළ)*

රසායන විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් 03 ක් සහිතව එකවර අ.පො.ස.(උසස් පෙළ) සමත් වීම හෝ ඉහත විෂයන් 02 ක් සහ කෘෂි තාක්ෂණවේදය විෂය සහිතව විෂයයන් තුනකින් අ.පො.ස.(උසස් පෙළ) එකවර සමත්වීම.

*සහ*

*අ.පො.ස. (සා.පෙළ)*

සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවද සහිතව විද්‍යාව, ගණිතය, සහ තවත් එක් විෂයක් ඇතුළුව සම්මාන සාමාර්ථ 04 ක් සහිතව එකවර විෂයන් (06) සමත්වීම.

2.2 *වෘත්තීය සුදුසුකම් :*

(i) රජය පිළිගත් සත්ත්ව පාලන විද්‍යාලයකින් පිරිනමන ලද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අනුමත කරන ලද සත්ත්ව පාලනය පිළිබඳ ජාතික ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

*හෝ*

(ii) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

*හෝ*

(iii) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑඅවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව

*හෝ*

(iv) ඊකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටම සුදුසුකම් සම්පූර්ණ කිරීම

(ප්‍රමුඛතාවය ලබාදෙනුයේ සත්ත්ව පාලන ඩිප්ලෝමාවක් සඳහාය. නියමිත සුදුසුකම් ලබන අය නොසිටියහොත් පමණක් ඉහත 2.2 හි අනු අංක II, III සහ IV සඳහන් සුදුසුකම් පිළිබඳ සලකා බලනු ලැබේ.)

2.3 *කායික සුදුසුකම් :*

වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2.4 *වෙනත් :*

(i) වයඹ පළාතේ වසර 03 ක ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය. (පදිංචිය ප්‍රාදේශීය ලේකම්වරයා අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)

(ii) අයැදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(iv) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2019.07.19 දිනට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(v) අයැදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

03. *සේවා කොන්දේසි :-*

3.1 මෙම තනතුර ස්ථිරය. සේවයට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ.

3.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුල සිය රාජකාරී වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් හා අනෙකුත් සේවය ස්ථිර කිරීම සඳහා වන අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

3.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුලත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව/භාෂා පිළිබඳ ප්‍රවීනතාව ලබාගත යුතුය.

3.4 ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස. (සා. පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවක් III වන ශ්‍රේණියේ වසර 5ක් ඉක්මවීමට පෙර ලබා ගත යුතුය.

3.5 මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ / උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, වයඹ පළාත් කාර්ය පටිපාටික රීති, වයඹ පළාත් මූල්‍ය රීතී සංග්‍රහයට හා විනය කාර්යය සංග්‍රහයට ද, දෙපාර්තමේන්තු නියෝගවලටද, වයඹ පළාත් සභා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට ද, රාජ්‍ය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට හා නියෝගවලටද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම නිලධාරීන් බැඳී සිටී.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ. විභාග විෂයය නිර්දේශයේ දැක්වෙන එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අයැදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණවල එකතුවේ ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමක් සිදු නොකරන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

05. *ලිඛිත විභාගය :-*

5.1 ලිඛිත විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.2 මෙම විභාගය ප්‍රශ්නපත්‍ර දෙකකින් සමන්විත වේ. සවිස්තරාත්මක විභාග විෂයය නිර්දේශයන් පහත පරිදි වේ :

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40%(අවමය) |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 1/2 | 100 | 40%(අවමය) |

*විභාග විෂයය නිර්දේශය :-*

(i) *බුද්ධි පරීක්ෂණය :*

ගණිතමය හැකියාව සහ තර්කන ශක්තිය මැන බැලීම අපේක්ෂා කෙරේ.

(ii) *විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය :*

කිරි ගව පාලනය , එළු පාලනය, කුකුල් පාලනය, සූකර පාලනය, ශ්‍රී ලංකාවේ ගව අභිජනන ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකාවේ කිරි ගව පාලනයට පවතින විභවය, ගොවිපල කළමනාකරණය, කිරි රසායනය, ආහාර සංරක්ෂණය, කිරි අතුරු නිෂ්පාදන සැකසීම, සත්ත්ව පාලනය සඳහා ඉංජිනේරු විද්‍යාව, ව්‍යාපෘති අධ්‍යයනය, තෘණ හා රණිල වගාව ආශ්‍රිතව කරුණු විමසීම සිදුකරන ප්‍රශ්න පත්‍රයකි.

06. *විභාග ගාස්තු :-*

විභාග ගාස්තු වශයෙන් රු. 600/- ක මුදලක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි ගෙවිය යුතුය. වයඹ පළාතේ පදිංචි අයැදුම්කරු/ අයැදුම්කාරිය තමන් ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එම මුදල ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබා ගත් ව.ප.ස.මු. 02 ලදුපත අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතුය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතුය.

07. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :-

7.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.07.19 වැනි දින හෝ එදිනට ප්‍රථම **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි, **"වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියේ තනතුර සඳහා විවෘත බඳවා ගැනීම - 2019"** යනුවෙන් සඳහන් කළ යුතුය.

7.2 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :-

මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥයකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියකු හෝ රු. 32,960/- ක හෝ රජයේ ඉහළ මාසික වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියකු විසින් සහතික කළ යුතු වේ.

7.3 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :- 2019.07.19

7.4 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හෝ නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අපැහැදිළි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින් ම දරා ගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

08. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

09. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය* :-

අපේක්ෂකයින් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලියවිලිවලින් විභාග ශාලාධිපතිට තහවුරු කළයුතුය.

*(අ)* ජාතික හැඳුනුම්පත;
*(ආ)* වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*සටහන* :

විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

10. විභාග ප්‍රවේශපත්‍ර :-

විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාල ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කාල සටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ (www.psc.nw.gov.lk) වෙබ් අඩවියේ නිවේදනයක් පළකරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර විභාග ප්‍රවේශපත්‍රය නොලැබිණි නම්, වහාම වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත පහත සඳහන් විස්තර සහිතව දැන්විය යුතුය. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය.

I. විභාගයේ නම
II. අයදුම්කරු / අයදුම්කාරියගේ සම්පූර්ණ නම
III. ජාතික හැඳුනුම්පත් අංකය
IV. ලිපිනය
V. අයදුම්පත්‍රය තැපැල් කළ දිනය හා ලියාපදිංචි කළ විස්තර

11. යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම් ලැබීමෙන් පසු හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

12. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණයද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ආර්. එම්. ආර්. එම්. රත්නායක,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 ජූනි මස 10 වැනි දින,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

**ආදර්ශ අයැදුම්පත්‍රය**

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

*වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම - 2019*

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

සිංහල - ☐ දෙමළ - ☐ ඉංග්‍රීසි - ☐

1. 1.1 මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :.........................................................................................

..........................................................................................................මයා/මිය/මෙනවිය

1.2 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : Mr./Ms./Mrs. ..............................................................

..........................................................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :.........................................................................................

..........................................................................................................මයා/මිය/මෙනවිය

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : Mr./Ms./Mrs. ..................................................................................................................

..........................................................................................................................................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) : ..........................................................................................................

..........................................................................................................................................................................

2.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..................................................................................................

..........................................................................................................................................................................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : ...................................................................................................................

..........................................................................................................................................................................

2.4 දුරකථන අංකය :- ........................................................

03. 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී - F [ ] පුරුෂ - M [ ]

3.2 උපන් දිනය :- වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

3.3 2019.07.19 දිනට වයස : අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

04. 4.1 අයදුම්කරු පදිංචි පරිපාලන දිස්ත්‍රික්කය :- ..................................................................................

4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- ...........................................................................................

4.3 ග්‍රාම නිලධාරි කොට්ඨාශය :- ................................................................................................

05. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :-*

5.1 අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

විභාගයේ වර්ෂය හා මාසය : ...............................

විභාග අංකය : .................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 01 | | 06 | |
| 02 | | 07 | |
| 03 | | 08 | |
| 04 | | 09 | |
| 05 | | 10 | |

5.2 අ.පො.ස (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

විභාගයේ වර්ෂය හා මාසය : ..............................

විභාග අංකය : ................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 01 | |
| 02 | |
| 03 | |
| 04 | |

5.3 *වෘත්තීය සුදුසුකම්.-*

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාලසීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

06. *විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :*

6.1 ලදුපත් අංකය : .................................. මුදල : ....................................
දිනය : ................................................
නිකුත් කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : .......................................................

ලදුපත මෙහි අලවන්න

07. *අයදුම්කරුගේ සහතිකය :*

*(අ)* මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවද, මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමටද එකඟ වෙමි.

*(ආ)* මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මෙම තනතුරට පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

.............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : .............................

08. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................................................. මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ................................ දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

දිනය : ......................................................................
සහතික කරන අයගේ නම : ......................................................................
අත්සන : ......................................................................
තනතුර හා නිල මුද්‍රාව : ......................................................................

(මෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 395,520/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.)

06 -791

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.